NILIS

# පුස්තකාලයාධිපතිත්ව උසස් සහතිකපත්‍ර පාඨමාලාව

## Advanced Certificate in Librarianship (පාඨමාලා කේතය: ACL)

ACL 2025/26

### 1) හැඳින්වීම

පුස්තකාලයාධිපතිත්ව උසස් සහතිකපත්‍රය (ACL) ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවෙහි (SLQF) 02 මට්ටමට අනුකූලව පිරිනමනු ලබන අතර, සහභාගිවන්නන්ගේ පුස්තකාලයාධිපතිත්ව දැනුම, ආකල්ප සහ කුසලතා වර්ධනය කිරිම අරමුණු කර ගෙන සැලසුම් කර ඇත. ACL පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරිම අපගේ (SLQF 3 මට්ටමෙහි) ඩිප්ලෝමා පාඨමාලාවකට ඇතුලත්වීමට සුදුසුකමක් ලෙස ද සැලකේ.

### 2) ඉලක්ක කණ්ඩායම

අ.පො.ස.(සා.පෙළ) සමතුන් සහ පුස්තකාල පිළිබඳ කෙටි කාලීන පුහුණුවක් පමණක් අවශ්‍ය අයවලුන් සඳහා.

### 3) පාඨමාලාවට බඳවා ගැනීමේ සුදුසුකම්

පාඨමාලාවට ඇතුළත් වීමට අවශ්‍ය අවම සුදුසුකම

- **අ.පො.ස.(සා.පෙළ)** විෂයයන් හයක් සමත් වීම.

**හෝ**

- **ඕනෑම විෂය ධාරාවක් ඔස්සේ ජාතික වෘත්තීය නිපුණතා 03 මට්ටම ( NVQ Level 3) හෝ ඉහළ මට්ටමක් සමත්වී තිබීම සහ පුස්තකාලයක වසර 01ක පළපුරුද්ද ලබා තිබීම හෝ පිළිගත් පුස්තකාලයක ස්ථිර තනතුරක් සහිත වීම.**

**සහ**


**තෝරාගැනීමේ පරීක්ෂණය සහ සම්මුඛ පරීක්ෂණය සමත්වීම.**

### 4) ඉගෙනුම් ඵල

මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසුව,

- විවිධ අවශ්‍යතා සහ අරමුණු සහිත පුද්ගලයන්ට සේවය කිරීම සඳහා පුස්තකාල ක්‍රියාත්මක වන ආකාරය නිදර්ශනය කිරීමට
- සාමාන්‍ය පුස්තකාල කාර්යයන් සම්පූර්ණ කිරීමට
- ප්‍රධාන තොරතුරු මූලාශ්‍ර හඳුනාගැනීමට
- මූලික සන්නිවේදනය සහ තොරතුරු ලබා ගැනීම සඳහා ICT සහ ඉංග්‍රීසි භාෂාව භාවිතා කිරීමට
- කියවීම ප්‍රවර්ධනය කිරීමට
- පුස්තකාල බාහිර ක්‍රියාකාරකමක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට

සහභාගිවන්නාට හැකි වනු ඇත




5) **වැඩසටහනේ වැදගත්කම:** ඔබ අ.පො.ස./උ.පෙ සම්පූර්ණ කර නොමැති නම්, ACL පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව, රූප සටහනේ දැක්වෙන පරිදි, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය විසින් පවත්වනු ලබන (SLQF Level 3) ඩිප්ලෝමා පාඨමාලා තුනෙන් එකකට ඇතුලත් වී උසස් ඩිප්ලෝමාව (SLQF Level 4) දක්වා ඉදිරියට යාමට හැකි වේ.

6) **පාඨමාලාවට අන්තර්ගත විෂයයන්**
   i. වෘත්තීය අධ්‍යයනය සඳහා සූදානම් වීම (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සහ ඉංග්‍රීසි)
   ii. පුස්තකාලය පිළිබඳ හැඳින්වීම
   iii. එකතුව සංවර්ධනය සහ කළමනාකරණය
   iv. තොරතුරු සේවා
   v. පුස්තකාල වර්ග
   vi. ව්‍යාපෘතිය

7) **පාඨමාලා කාලය :** මාස 06 (දේශන වැඩි ප්‍රමාණයක් මාර්ගගතව පැවැත්වේ).

8) **මාධ්‍ය -** සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි (එක් එක් මාධ්‍යයෙන් පංති පැවැත්වීම එම මාධ්‍ය සඳහා සිසුන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ලියාපදිංචි වීම මත රඳා පවතී).

9) **ඇගයීම් ක්‍රමවේදය:** සෑම විෂයක් සඳහාම ලබාදෙන ඇගයීම් ක්‍රියාකාරකම් සහ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම මගින්.

10) **පුස්තකාලයාධිපතිත්ව සහතිකපත්‍රය ලබා ගැනීමට නම්**
පුස්තකාලයාධිපතිත්ව සහතිකපත්‍රය ලබා ගැනීමට නම් පාඨමාලාලාභීන් සෑම විෂයයකටම අවම වශයෙන් 50% ක ලකුණු ලබා ගත යුතුය.

11) **පාඨමාලා ගාස්තු:** රු.25,000/= ( එක් වාරිකයකින් ගෙවිය යුතුය).

12) **වැඩසටහන් ආරම්භය: 2025 අගෝස්තු**

13) **අයදුම් කරන ආකාරය**
   **i.** අපගේ වෙබ් අඩවියෙන් (nilis.cmb.ac.lk) අයදුම්පත බාගත කරන්න.
   **ii.** අයදුම් පත්‍රය හැකිතාක් පැහැදිලිව පුරවන්න.
   **iii.** උප්පැන්න සහතිකයේ, අධ්‍යාපන සහතිකවල සහ ජාතික හැඳුනුම්පතේ සහතික කළ පිටපත් අමුණන්න.
   **iv.** මහජන බැංකුව, තිඹිරිගස්යාය ශාඛාවේ අංක 086100101191736 දරන ගිණුමට අයදුම්පත් ගාස්තුව ලෙස රු.300.00 ගෙවා, රිසිට් පත අයදුම්පතෙහි අදාළ කොටුවේ අලවන්න.
   **v. නිසිලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2025.07.04 දින හෝ එදිනට පෙර ලැබෙන සේ පහත ලිපිනයට තැපැල් කරන්න.**

"ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
ජාතික පුස්තකාල සහ තොරතුරු විද්‍යා ආයතනය (NILIS)
කොළඹ විශ්වවිද්‍යාලය
කොළඹ 03"
දුරකථන: 011 2507150 / 0701478619